සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
**First Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 01 |

සැලකිය යුතුය.

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.
ii. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති **1,2,3,4** යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
iv. එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ,ඒවා ද පිළිපදින්න.

---

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන් මුද්‍රිත** කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වචනය තෝරන්න.

1. **ඉවක් බවක් නැති ව** කැලෑ එළි කිරීම අනාගත මහා විනාශයකට අත වැනීමකි.
   (1) සම්පූර්ණයෙන් ම (2) අපරීක්ෂාකාරී ව (3) නොසැලකිල්ලෙන් (4) අධික වේගයකින්

2. අසාධාරණයෙන් ලබා ගන්නා දෙයින් කිසිම **වගතුවක්** නොවන බව උන් වහන්සේ වදාළ සේක.
   (1) වගකීමක් (2) නිරෝගීභාවයක් (3) ප්‍රතිඵලයක් (4) යහපතක්

3. හිතවතුන්ට **ආඩපාළි කීම** දැන්වත් නැවැත්විය යුතු බව පක්ෂ නායකයෝ තීරණය කළහ.
   (1) දොස් කීම (2) වෛර කිරීම (3) බොරු කීම (4) කලහ කිරීම

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස් තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

4. විවිධ පොතපත මෙන් ම විවිධ විෂය කරුණු සොයා ගැනීමට ද පාඨකයන්ට විශ්වකෝෂවලින් මහත් .......................සැපයේ.
   (1) පිටුවහලක් (2) පරිශ්‍රමයක් (3) පරිහරණයක් (4) පිටුබලයක්

5. ලක්දිව සිටි ........................ ලේඛකයකු වූ සෙනරත් පරණවිතාන මහතා ශ්‍රේෂ්ඨ පුරාවිද්‍යාඥයෙකි.
   (1) චතුර (2) කාර්යක්ෂම (3) චිරන්තන (4) විදග්ධ

6. සාහිත්‍ය රස වින්දනයට උචිත භාෂා ශෛලියක් යොදා ගැනීමේ .................... මෙකල ලේඛකයන් හමුවේ පවතී.
   (1) අභිරූපණය (2) අභියාචනය (3) අභියෝගය (4) අභිලේඛනය

7. අකාරාදි පිළිවෙළ නිවැරදි ව  දැක්වෙන පද පේළිය තෝරන්න
   (1) මරුවැල්,මාවතේ ගීතය, මායාකාරී,මාගේ දේශය
   (2) ගලිවරගේ චාරිකා, ගැටවර විය, ගැහැනියක්, ගොඩ මණ්ඩිය
   (3) රටවට, රුවන්වැකි, රාජාවලිය, රාමායනය
   (4) සීරිගීය, සෙවණැලි ඇද මිනිස්සු, සේරි වාණිජ, සේතුහාමි

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) උත්කෘෂ්ට,විශිෂ්ට, සාමර්ථ්‍යය, කනගාටු
   (2) සංකලණ, මැතිණිය,ඖචිත්‍යය, කල්‍යාණ
   (3) බළතල, පිලිසඳර, පාපිෂ්ට, ආභාසය
   (4) පරිගණකය, ලේකම්, යථාර්තය, විහිළු තහළු

9. පා පිල්ල, ගැට ඇලපිල්ල, රකාරාංශය, ඇලපිල්ල, අනුපිළිවෙළින් යෙදී ඇති උත්තරය තෝරන්න.
   (1) රුවන, කෘදන්ත, සත්‍යය, තිර
   (2) නුවණ,කූඩය, ග්‍රහයා, කාසිය
   (3) මුහුද, සෘතුව, ක්‍රමය, රුහැන,
   (4) රුවල, දෘඪ, ප්‍රවර, සාධක

10. උපසර්ග පද පමණක් යෙදී ඇති පිළිතුර තෝරන්න.
   (1) අරහයා, උදෙසා, අගුණ,ඉමිහිරි
   (2) නිස්සාර, විස්මය, සුදන, උදුල
   (3) අත්‍යවශ්‍ය, අනුකම්පා, පිළිගනි, උපමාන
   (4) ඉක්බිති, අභ්‍යවකාශ,අභිමාන, අනුභාව

11. “මෙන  රම්බා හිමි රූ සිරිනි   මනහර  ” යන පද්‍ය පාදයේ ‘මෙන’ යනු
   (1) නාම පදයකි   (2) නිපාත පදයකි   (3) ක්‍රියා පදයකි   (4) උපසර්ග පදයකි

12. කාන්තාවට,කුරුල්ලෝ,ගස,රිළවුන්, යන නාම පදවල ප්‍රකෘති වන්නේ
   (1) කාන්තාව, කුරුල්, ගස, රිළවා
   (2) කාන්තා, කුරුලු, ගස්, රිළා
   (3) කාන්තාව, කුරුලු,ගස්,රිළා
   (4) කාන්තා, කුරුල්ලා,ගස,රිළවා

13. තත්සම වචන පමණක් ඇති පිළිතුර තෝරන්න
   (1) චාතුර්ය, තාරුණ්‍යය,අන්ත,කල්පාන්ත
   (2) සඳ, අඳුර,පොළෝ, ත්‍රිපිටක දහම
   (3) මුග්ධ, පැරකුම්බා,ශ්වේත චත්‍ර, මිග
   (4) සත්ව උද්‍යානය, ගන අඳුර, පිරිත් දේශනය, පොත්

- අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන් මුද්‍රිත** කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

14. **ක්ෂුධාවෙන්** පීඩිත ව වැතිරී සිටි මගියා දෙස ඔහු හැරී බැලුවේ ය.
   (1) මහන්සියෙන්   (2) දුකෙන්   (3) බඩගින්නෙන්   (4)  ඊර්ෂ්‍යාවෙන්

15. ජලයට විවිධ අපද්‍රව්‍ය දැමීම **ආපත්ති**  කාරණයක් බව ධර්මයෙහි  සඳහන් වේ.
   (1) විපත් ගෙන දෙන   (2) වර්ණ වෙනස් වීමේ  (3) නො කළ යුතු  (4)  දඬුවම් ලැබිය යුතු

16. ලේඛකයාගේ නිර්මාණාත්මක **කෞශල්‍යය** සිය කෘතිය කෙරේ නොමඳ බලපෑමක් කරයි.

(1) කුතුහලය (2) කෞතුකය (3) කුසලතාව (4) උද්‍යෝගය

17. "උදෙන් ම කා බී පරිසර සිරි විඳිමින් පාසලට එන්න" ඉහත වාක්‍යයේ ඇති ක්‍රියා පද පිළිවෙළින් දැක්වෙන උත්තරය තෝරන්න.

(1) ප්‍රයෝජ්‍ය ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා , අවසාන ක්‍රියා

(2) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා

(3) පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, විධි ක්‍රියා

(4) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා

18. කප,දුව,නට යන පද **අයත් වන** ව්‍යාකරණ ප්‍රවර්ගය තෝරන්න.

(1) නාම ප්‍රකෘති (2) ධාතු ප්‍රකෘති (3) නිපාත (4) උපසර්ග

19. එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලක් ඇතුළත් **නො වන** පද පේළිය තෝරන්න.

(1) ප්‍රහර්ෂය -සතුට, ආගමනය- පැමිණීම, සූක්ෂ්ම -සියුම් , ස්මරණය -සිහිකිරීම

(2) මනෝසිලා -රත්හිරියල්, කූට ප්‍රාප්තිය-ඉහළම අවස්ථාව, ඕෂධී තාරකා -දවහත් තරු, ප්‍රකාශන විලාසය-ලේඛන ශෛලිය

(3) අසේව - වෙහෙසව, වෙහෙල් -මුව , චුම්බිත-සිඹිනා ලද,ගොන්ගේ -හරක් බාන

(4) පදප ශ්‍රේණි - ගස් පංති, ලොලය-ආශාව, පුන්කුඹු -පිරුණු කළගෙඩි,සිලිලාර-ශීතල සුළඟ

20. විරුද්ධාර්ථවත් පද යුගලයක් **නො වන්නේ** මින් කුමක් ද?

(1) ප්‍රතිගාමී-ප්‍රගතිශීලී (3) ශෘංගාර -විප්‍රලම්බ

(2) ආකාර-විකාර (4) උත්තීරණ-විස්තීරණ

21. "එයින් වර්ගෝන්නතිය ද වැඩේ මැයි" යන්නෙහි 'වර්ගෝන්නතිය' , යන්න වෙනුවට යෙදිය හැකි වඩාත් ම යෝග්‍ය පදය කුමක් ද?

(1) වර්ගයාගේ පිරිහීම (2) ජාතියේ දියුණුව (3) ජාතික අභිමානය (4) විවිධ වර්ගවලට අයත්

22. වැරදි අදහස දෙන වාක්‍යය තෝරන්න.

(1) 'එපා' යන පදය නිපාතයකි.

(2) හිරු බසිත සඳ නැග එයි, යන්නෙහි 'බසිත' යනු අසම්භාව්‍ය ක්‍රියා පදයකි.

(3) 'හිරමනය' යන්නෙහි නාම ප්‍රකෘතිය 'හිරම' යන්නයි.

(4) නුඹ, ගැහැනියක්,කෙනෙක්,ළමයි, යන්න උක්ත පද වේ.

23. දූටා, කියහං ,කන්ට,පොල් පොත්ත යන ජන වහර භාවිත වන ප්‍රදේශ වන්නේ

(1) මොනරාගල,දකුණ,උඩරට,මොනරාගල

(2) උඩරට,මොනරාගල,දකුණ,උඩරට

(3) උඩරට,නුවර කලාවිය,දකුණ,මොනරාගල

(4) මොනරාගල,දකුණ,උඩරට,දකුණ

24. **'සිතින් මවා ගත්'** යන්නට යෙදිය හැකි තනි වචනය තෝරන්න.

(1) අයස්කාන්ත (2) මනස්කාන්ත (3) මනඃකල්පිත (4) ආකල්පිත

25. **සන්ධි නොවූ පදයක්** ඇති වරණය තෝරන්න.

(1) දැත,මාර්ගෝපදේශක,ජීවිතාශාව,ගෙනාවා
(2) විද්‍යායතනය,මිතුරෙක්,නෙතගින්,ඉඳුනිල්
(3) ප්‍රීත්‍යුත්සවය,උනුන්,වීරෝදාර,සුළැඟිල්ල
(4) පුනරුච්චාරණ,ඉෂ්ටානිෂ්ට,නාටෝෝචිත,ජාතිකෝත්සවය

- අංක 26 ,27 යටතේ දී ඇති අදහසට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ තෝරන්න.

26. යමක ප්‍රමාණය ඉක්මවීමෙන් නරක ප්‍රතිඵල ලැබේ.

(1) බඩේ ඉන්න දරුවට හඳහන් හදන්නා වගේ
(2) කොස් ඇති තැනටම ලු දෙලුත් කිව්ව ලු
(3) ආතාට අටුකොස් දුන්නා වගේ
(4) අතිරසත් තිත්ත වෙනවා ලු

27. තද අකමැත්තෙන් යමක් දීම

(1) කිඹුල් පැටවුන්ට පීනන්න උගන්වනවා වගෙයි.
(2) ඇහෙන් ඇටයක් ගියා වගේ
(3) කුඩැල්ලා මෙට්ටේ තියන්ඩ බෑ වගේ
(4) ගොඩ ඉදන් නැව් පෙරළන්නා වගේ

- පහත ප්‍රකාශ අතුරින් **නිවැරදි** පිළිතුරු තෝරන්න.

28. ‘නටති’ යනු

(1) ප්‍රථම පුරුෂ,බහුවචන,කර්තෘ කාරක,වර්තමාන කාල,ක්‍රියා පදයකි.
(2) මධ්‍යම පුරුෂ, ඒක වචන,භාව කාරක,වර්තමාන කාල, ක්‍රියා පදයකි.
(3) උත්තම පුරුෂ, බහුවචන,කර්ම කාරක,අතීත කාල,ක්‍රියා පදයකි.
(4) ප්‍රථම පුරුෂ, බහු වචන,කර්ම කාරක,වර්තමාන කාල,ක්‍රියා පදයකි.

29. මුල් පදයේ **පමණක්** අර්ථය ඇති යුගල පද සහිත වරණය තෝරන්න.

(1) ගඩා ගෙඩි,ආටක නාටක,හාවක් හූවක්, අලා මුළා
(2) හදා වඩා,ඇන කොටා, තෝරා බේරා,තළා පෙළා
(3) පැල පදියන්, රණ්ඩු සරුවල්, කතා බතා
(4) ගුණ දොස් , යුතු අයුතු, අතන මෙතන, ඇවතුම් පැවතුම්

30. A ගම අමතකයි - මහගමසේකර
B ඔපනැලි - කුරහන් කැපූ පසු ඉතිරිවන කොටස්
C ඉර රාජ පැළෑටිය - වැවෙන්නේ ලංකාවේ පමණි
D“ පියුමම්බා නිතොර ව රැඳි උර මැඳුර ” - මෙහි රූපකයක් යෙදී තිබේ.

A,B,C,D ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ

(1) A,C හා D ය. (2) B,C හා D ය . (3) A,B හා C ය . (4) A, B හා D ය.

- අංක 31 ,32 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව **නිවැරදි** වාක්‍ය තෝරන්න.

31. 1) මා නොහොත් නුඹ ගී කියන්නෙහි.
2) බාල දක්ෂිකාවෝ සමඟ ගුරුවරු ද උත්සවයට සහභාගි වෙති.
3) පක්ෂ නායකයෝ ද සභාපතිවරු ද රැස්වීමට ආහ.
4) ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ප්‍රේක්ෂකාගාරයට එති’යි අපි බිය වීමු.

32. 1) අප සිංහයෝ සේ එඩිතර වෙමු.
2) කුරුල්ලෝ හෙවත් පක්ෂීහු වනාන්තරවල සැරිසරති.
3) ගුරුවරුන් හොඳින් විෂය කරුණු උගන්වති.
4) රැස්වීමට සියලු දරුවෝ පැමිණ නැත.

33. පහත දී ඇති කර්ම කාරක වාක්‍යවලින් **නිවැරදි** වරණය තෝරන්න.
1) A අම්මා විසින් මා නළවන ලදි.
2) B ගුරුවරුන් විසින් පොත් ලියැවෙයි.
3) C බැතිමතුන් විසින් දේව පූජාවෝ කෙරෙති.
4) D සොරුන් විසින් දැරියක් පැහැර ගැනුණා ය.

1) ABC 2) ACD 3) ABD 4) BCD

34. ළමයා, මම,කිඹුලා, තෝ යන වචනවල බහුවචන අනුක්ත පදය තෝරන්න.
1) ළමයි,මම,කිඹුලා,තා
2) ළමයින්, මා,කිඹුලන්,තොප
3) ළමයින්,අප,කිඹුලන්,තොප
4) ළමා,අපි,කිඹුල්ලු,තොපි

35. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන ග්‍රන්ථයක නිවැරදි නාමය තෝරන්න.
1) යණිහිසවක් 2) තවිමීගමීළ 3) ත්‍රාකනේසු 4) පනේවසාස්

36. “මං ඒ අය එක්ක යාළු වුණා ” යන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වරණය තෝරන්න.
1) මම ඔව්හු හා මිත්‍ර වීමි.
2) මා ඔවුන් හා යාළු වුණෙමු.
3) මම ඔවුන් හා මිත්‍ර වීමි.
4) මම ඔවුන් හා මිත්‍ර වූවෝ ය.

37. සුනේත්‍රා, කාව්‍යශේඛරය,වක්කඩ බඳිමු, බුත්සරණ යන ග්‍රන්ථයන්හි කතුවරුන් අනුපිළිවෙළින් යෙදුණු පිළිතුර තෝරන්න.
1) ඩබ්.ඒ.සිල්වා,ශ්‍රී රාහුල හිමි,ගුණදාස අමරසේකර,විද්‍යාචක්‍රවර්ති
2) මාර්ටින් වික්‍රමසිංහ,වීදාගම හිමි, මහගමසේකර,ගුරුළුගෝමී
3) ඇරැව්වල නන්දිමිත්‍ර, වෑත්තැවේ හිමි, සිරි ගුණසිංහ, මයූරපාද පරිවේණාධිපති හිමි
4) ඩබ්.ඒ.සිල්වා, වීදාගම හිමි ,ගුණදාස අමරසේකර,දෙවන පණ්ඩිත පරාක්‍රම බාහු

38. 1) පහත සඳහන් කවියේ හතරවැනි පදය තෝරන්න

“ පැසෙයි නිබඳ සුවඳැල් කෙත්වත් අවට
ඇසෙයි ළමා වසු පැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට
............................................................ ..........”

1) සැලළිහිණිය වදු කැලණිය පුරවරට
2) කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට
3) රසෙයි අමා රසමය ඒ පියස දුට
4) කුරහන් පැහී මොකටද උඹ නැති දාට

39. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

“සාහිත්‍ය කෘතියේ අන්තර්ගතය නිර්මාණකරුවාගේ අත්දැකීම් මත පදනම් වෙයි. ඔහු අසා,දැක, කියවා,විඳ ඇති දේ ඇසුරෙන් පරිකල්පනය මගින් ගොඩ නැගූ යථාර්ථය නිර්මාණයේ අන්තර්ගතය වෙයි.

1) සාහිත්‍ය කෘතියක් නිර්මාණය කරන්නාගේ අත්දැකීම් හා අසා කියවා විඳ ඇති දේ පරිකල්පනය කොට ගොඩ නැගූ යථාර්ථයේ අන්තර්ගතය වෙයි.
2) අත්දැකීම් මෙන් ම අසා,දැක,කියවා,විඳි දේ මුල්කරගෙන ගොඩ නැගූ යථාර්ථය නිර්මාණයක අන්තර්ගත වෙයි.
3) පරිකල්පනය මගින් අත්දැකීම් ද අසා ,දැක,විඳ ඇති දේ මඟින් කෘතියක අන්තර්ගතය ද ඇති වේ.
4) කෘතියක් නිර්මාණය වන්නේ අත්දැකීම් හා පරිකල්පනය යන ක්‍රම දෙක මඟිනි.

40. ‘බෝ’ ශාකය විවිධ භාෂාවල විවිධ නම්වලින් හඳුන්වා තිබේ.ඊට අයත් නොවන වචනයක් සහිත වරණය තෝරන්න.

1) අශ්වත්ථ 2) අරචු 3) පිපල් 4) ඉරමුසු

(ලකුණු 40)

සියලු ම හිමිකම් ඇව්රිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
**First Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 02 |

- සැලකිය යුතුයි.
- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

---

01. (I) සිට ( x) තෙක් ඇති සියලු ම ප්‍රශ්නවල අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න.කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් ,එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අදින්න.

(i) සිංහල වර්ණ මාලාවේ ඇතුළත් සංයුක්ත ස්වර දෙක ලියා දක්වන්න.

(අ) (ආ)

(ii) පහත සඳහන් පද විසන්ධි කොට ලියන්න.

(අ) සිවුරඟ (ආ) පන්දහස්

(iii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

" න්‍යෂ්ඨික බලයෙන් ක්‍රියා කරන ප්‍රථම සබ්මැරීනයට උත්තර ද්‍රුවයේ හිම තට්ටුව යටින් ගොස් අනෙක් පසින් මතු වීමට හැකි විය."

(iv) පහත පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

(අ) කුලීන (ආ) විරල

(v) පහත දැක්වෙන පදවල අර්ථය පහදන්න.

(අ) පිරි කුඹු (ආ) මෙරමා

(vi) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය.ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) මම හෝ ළමයා වැඩ කරමි.

(ආ) අපි සුවසේ වෙසෙති'යි සොයුරිය ලියා යැවූවා ය.

(vii) පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.

(අ) මඟ සලකුණු නිවැරදි ව **බලතොත්** ගමන සාර්ථක වන්නේ ය.

(ආ) සැරද සුළකළ'කුරු -මියුරු තෙපලෙන් **රඳනා**

(viii) මෙහි (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) කළ වරද ගැන කනගාටු වීම
(ආ) යම් කෙනෙකු වෙනුවට පෙනී සිටින්නා

(ix) පහත සඳහන් වාක්‍ය දෙක කර්තෘ කාරකයට හරවා ලියන්න.

(අ) ධර්මසේන හිමියන් විසින් සද්ධර්මරත්නාවලිය ලියැවිණි.
(ආ) දෙමාපියන් විසින් අපි රැකුණෙමු.

(x) පහත දැක්වෙන (අ) සහ (ආ) යෙදුම්වල පළමු වැනි වචනය සමග දෙවෙනි වචනයේ නොගැළපීමක් ඇත.ගැළපෙන සේ පළමුවෙනි වචනය හෝ දෙවෙනි වචනය හෝ සකස් කර ලියන්න.

(අ) බ්‍රාහ්මණ ගම (ආ) දෙටු පුත්‍රයා

( ලකුණු 2x10=20 )

02. පහත දැක්වෙන (අ) , (ආ) ,(ඉ) ,(ඊ) , යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

- අන්තර්ගත විය යුතු කරුණු
- ඡේද සංඛ්‍යාව
- කරුණු පෙළ ගැස්වීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ
- යොදන මාතෘකාව ; ආදිය පිළිබඳව මග පෙන්වීමක් අදාළ විස්තරය ඇසුරෙන් ලබා ගන්න.

(අ) පරිසරය සමග එක්ව බැඳී ජීවත් වූ අපේ අතීත මුතුන්මිත්තන්ගේ ජීවන පැවැත්ම මෙන් ම ගති පැවතුම් හා ජීවිත අපේක්ෂාවන් සරල විය. සිතෙහි උපදින කාව්‍යයේ හැඟුම් සරල සුගම පද හතරක් බවට පෙරළී, කට වහරින් පාරම්පරිකව පැවැත ඒම ජනකවියේ ප්‍රධාන ලක්ෂණයකි. කවර අරමුණක් පාදක ව ජනකවිය බිහි වුව ද එහි සන්නිවේදන ලක්ෂණය කැපී පෙනෙයි.

(ආ) සන්නිවේදන තාක්ෂණය දියුණු වීම ලෝකය කුඩා කර මිනිස් වර්ගයා අතර,අන්‍යොන්‍ය බැඳියාව ළං කිරීමට හේතු වී ඇත. පුවත්පත .ගුවන් විදුලිය, රූපවාහිනිය .අන්තර්ජාලය හා ජංගම දූරකථනය ප්‍රධාන වශයෙන් සන්නිවේදන මාධ්‍ය ලෙස හැඳින්වෙන අතර, මේවා අධ්‍යාපනය කෙරේ බලපාන ආකාර විචාරවත් ව විමසීමට ලක් විය යුත්තකි. දෙපැත්ත කැපෙන ආයුධයකින් වැඩ කිරීම පරිස්සමෙන් කළ යුත්තක් මෙනි.

(ඉ) දැනුමෙන් ,හැකියාවෙන් ,කායික ශක්තියෙන් , මානසික ශක්තියෙන් පිරිපුන් පිරිස තරුණ හෙවත් යෞවන වදනින් අරුත් වේ. ළමා වියේ කඩඉම් සීමාව පසු කොට එළඹෙන තාරුණ්‍යය මුහුණ දෙන කායික,මානසික,සංස්කෘතික , ආර්ථික හා සාමාජික ගැටලු දෙස දයාර්ද්‍ර ඇසකින් බැලීමට රටක වැඩිහිටි පරම්පරාවට අවබෝධයක් තිබිය යුතු ය. එවිට ඔවුන්ට වඩා යහපත් හෙටක් උදා වනු ඇත.

(ඊ) සමබර පෞරුෂයක් ඇති කර ගැනීමට ක්‍රීඩාව මඟින් ඉටු කෙරන මෙහෙවර අපමණ ය. එමඟින් ශාරීරික,මානසික හා සමාජීය වර්ධනයෙන් යුත් ජනකායක් බිහි කරයි.ලොව පුරා විවිධාකාර ක්‍රීඩා උත්සව පැවැත්වෙන අතර, අප රටේ ක්‍රීඩකයෝ ද ජයග්‍රහණ රැසක් ලබා සිටිති.මේ පිළිබඳ සැමගේ අවධානය යොමු කිරීම සිදු විය යුත්තකි.

(ලකුණු 25)

03. පහත දැක්වෙන ඡේදය වචන 50 – 55 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

ලෝකයේ බිහි වූ සැම සුභග ගණිතඥයන්ට ,විද්‍යාඥයන්ට මෙන් ම දර්ශනවාදීන්ට ද භාෂාව තරම් ප්‍රයෝජන වූවක් තවත් නැත.තමාගේ සිතිවිලි පැවැත්ම ඇති වීමට ,අවබෝධය ලබා ගැනීමට,තමා අවබෝධ කරගත් දේ ප්‍රකාශ කිරීමට ප්‍රධානතම මාධ්‍ය වන්නේ භාෂාව යි . අයින්ස්ටයින් තමාගේ දැනීම සොයා ගත්තේ භාෂාව මඟිනි. එම දැනුම පැතිරවීමට යොදා ගත්තේ ද භාෂාව යි. යම් කිසිවෙකු භාෂාවකට විශිෂ්ට දක්ෂතාවක් දක්වතොත් එය බුද්ධිමත් භාවයේ ලකුණක් හැටියට මනෝවිද්‍යාඥයෝ පිළිගනිති. බුද්ධිමත් භාවය මැනීමට යොදා ගන්නා සාධකය භාෂාව යි. එම පිළිගැනීමට අනුව යම් කිසිවෙකු විද්‍යා අංශයට හෝ වෛද්‍ය අංශයට හෝ තෝරා ගැනෙන්නේ ඔහු භාෂාව පිළිබඳ දක්වන දක්ෂතා අනුව ය. බුද්ධි පරීක්ෂණයක ප්‍රධාන අංගය භාෂාව සම්බන්ධිත ප්‍රශ්න වනුයේ ඒ නිසා ය. සාධක විග්‍රහ කිරීමේ විද්‍යානුකූල ක්‍රමය අනුව භාෂාවක දක්ෂතාව උසස් බුද්ධියක ලක්ෂණයක් බැව් විද්‍යාත්මක ලෙස මනෝ විද්‍යාඥයෝ පෙන්වා දෙති. භාෂාවට දක්ෂ දරුවා ගණිතයට ද දක්ෂයෙක් වෙයි. විද්‍යාවට දක්ෂ පුද්ගලයා භාෂාවට ඉතා ම දක්ෂයෙකු විය යුතුම ය. විද්‍යාඥයා භාෂාව පිළිබඳ දක්ෂතාව පෙන්වීමට සාහිත්‍ය කෘති නො ලියයි. එහෙත් අදහස් පැහැදිලිව ම අවබෝධ කර ගැනීමටත් තමා සකසා ගත් සංකීර්ණ වූත් ,ගැටලු සහිත වූත් න්‍යායක් ඉදිරිපත් කිරීමටත්, ඔහුට ආධාර වන්නේ භාෂාව යි.

(ලකුණු 10)

04. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

තොටගමුවේ සිරි විජයබාහු පිරුවන කෝට්ටේ යුගය විදු එළියෙන් බැබළවූ ප්‍රධානතම අධ්‍යාපන ආයතනය විය.දක්ෂිණ ලංකාවෙහි තොටගම ගමෙහි වූ තොටගම වෙහෙරෙහි මහා විජයබාහු රජු විසින් ඇරඹුණු පිරිවෙන විජයබාහු පිරිවෙන නමින් හැඳින්විණි. මෙය ආරම්භ කෙරුණේ කෝට්ටේ යුගයෙහි නොවේ. කුරුණෑගල යුගයෙහි විසූ මහා විජයබාහු නොහෙත් විජයබාහු රජු විසිනි. ඒ බව තොටගමු වෙහෙර පිළිබඳ ව මහා වංශයෙහි වන තොරතුරු සාක්ෂ්‍ය දරයි. නොයෙක් සංදේශ කාව්‍යයන්හි තොටගමුවේ විජයබාහු පිරිවෙන පිළිබඳ ව ද , ශ්‍රී රාහුල මහා හිමියන් පිළිබඳව ද සඳහන් ය. තොටගමුවේ විජයබා පිරිවෙන පිළිබඳ ව සඳහන් වන පළමුවැනි සංදේශ තිසරය යි. කොවුල් සදෙසෙහි තොටගමු පිරුවන් වෙහෙරෙහි වන නාථ දෙවියන්ගේ පිළිමය "ඉතා ගන නිල් පිළිමය " පොරණ ලකුණු යුතු දාගැබ" පිළිබඳව ද සඳහන් වේ. එම යුගයෙහි සමාජයෙහි පැවැති දැඩි දේව විශ්වාසය මෙයින් පැහැදිලි වේ. ගිරා සඳෙස තොටගමු වෙහෙර ගැන ද, පිරුවන ගැන ද විසිතුරුව වර්ණනා කරයි. එය අබිදහම ,විනය වේදාර්ථ, ග්‍රහ ගණිතය,වෛද්‍ය ශාස්ත්‍රය,වියරණය අර්ථ ශාස්ත්‍රය හෙවත් නීති ශාස්ත්‍රය ,ඡන්දාලංකාර,සංස්කෘත, මාගධ,සිංහල ,දෙමළ ,කාව්‍ය,නාටක ආදී විෂයයන් එහි ඉගැන්විණි. මේ විෂය ධාරාව පිළිබිඹු කරන්නේ එකල පැවැති අධ්‍යාපන ක්‍රමයේ දේශිය, අනුරූප භාවයත්,විශිෂ්ටත්වයත් ය. එමඟින් බිහි කෙරුණේ සම්පූර්ණ පාණ්ඩිත්‍යයෙන් හෙබි ශිෂ්‍යයෝ ය.තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ස්වාමි ආදී ෂඩ්භාෂා පරමේශ්වරයෝ ය.

I. තොටගමුවේ විජයබා පිරිවෙන ආරම්භ කළ රජතුමා හා යුගය දක්වන්න .
II. තොටගමුවේ විජයබා පිරිවෙන පිළිබඳ ව තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර දෙකක් දක්වන්න.
III. පිරිවෙනෙහි ඉගැන් වූ විෂයයන් දෙකක් ලියන්න .
IV. එවැනි විෂය ධාරාවකින් පිළිබිඹු කරන්නේ කිනම් කරුණු ද ?
V. අර්ථ පහදන්න
(අ) පොරණ (ආ) ෂඩ්භාෂා

(ලකුණු 2x5= 10)

05. පහත දැක්වෙන විස්තරය පදනම් කොට ගෙන අත් පත්‍රිකාවක් සකස් කරන්න. මේ සඳහා වචන 100 ක් පමණ යොදා ගැනීම ප්‍රමාණවත් ය.

ඔබගේ ගම් ප්‍රදේශයේ පැවැත්වෙන සිංහල අලුත් අවුරුදු උලෙළට සහභාගී වන ලෙස ගම්වැසියන් දැනුම්වත් කරමින් දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න. වචන 125 ක් පමණ සෑහේ. දිනය,වේලාව.ස්ථානය,තරග සඳහා සුදුසුකම්, ත්‍යාග හා අලුත් අවුරුදු විශේෂාංග යන කරුණු ඇතුළත් විය යුතු ය.

- නැතහොත් -

හලාවත විජයකටුපොත මධ්‍ය මහා විද්‍යාලය තම 50 වන සංවත්සර උලෙළ නිමිත්තෙන් අධ්‍යාපන හා වෙළෙඳ ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු සංවිධාන කොට ඇත. ඒ හා සම්බන්ධ තොරතුරු ඇසුරෙන් ප්‍රදේශවාසීන් දැනුම්වත් කිරීමට සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න. ඔබ පාසල් සංවර්ධන කමිටුවේ ලේකම් යැයි සිතන්න.

දිනය - 2018.05.10
වේලාව - පෙ.ව.9.00 - ප.ව.6.00
ස්ථානය - හලාවත විජයකටුපොත ම. ම. වි.
ප්‍රදර්ශන කුටි - අධ්‍යාපනික (විද්‍යා ,සාහිත්‍ය ,කාර්මික...... )
වෙළෙඳ කුටි - ඇඳුම් ,විසිතුරු,පාවහන් ,ආහාර ...
ප්‍රධානත්වය - පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා
සහභාගීත්වය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා
මෙහෙයවීම - විද්‍යාලයීය පාසල් සංවර්ධන කමිටුව

(ලකුණු 15)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 11 | |
| විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | |
| පත්‍රය / வினாத்தாள் / Paper | III | |
| කාලය / காலம் / Time | පැය 02 | |

සැලකිය යුතුයි:

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

(01) (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) ''පුත මේ යුක්තිය සලකා පියා කියව''

(අ) මෙම ප්‍රකාශය කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(ආ) 'පුත' යනුවෙන් ආමන්ත්‍රණය ලැබූ අයගේ නම ලියන්න.

(ii) ''සුර ගඳඹුන් ලෙසට
පටන් ගෙන වෙණ ගායනාවට''

(අ) 'ගඳඹුන්' යන්නෙහි තේරුම ලියන්න.

(ආ) මෙම පද්‍ය පාදය රසවත් කිරීමට යොදා ගත් කාව්‍යාලංකාරය කුමක් ද?

(iii) ''මිනිහා අනුමානයක් නෑ මැරෙන්න ඇති''

(අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කරනු ලැබූවක් ද?

(ආ) 'මිනිහා' යයි අදහස් කළ අයගේ නම ලියන්න.

(iv) ''ජාතික රණ දෙරණ මතේ
ගැටී වැටී මළ මොහොතේ''

(අ) මෙහි ඉතිරි පද්‍ය පාද දෙක සම්පූර්ණ කරන්න.

(ආ) මෙම පද්‍යය උපුටාගත් ග්‍රන්ථය සඳහන් කරන්න.

(v) 'කිම් ද මැණියනි ඔබ මේ
පවසන වදනා
ඇස් කන් ඇඳහිය නොහේ ය
ඇසෙන මෙ අරුමා'

(අ) මෙම ප්‍රකාශය කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(ආ) එසේ ප්‍රකාශ කිරීමට හේතුව කුමක් ද?

(vi) ''සොඳුර මම යන්නට නො නිස්සෙමි''

(අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දක් ද?

(ආ) මෙසේ යන්නට නුසුදුසු ගමන කුමක් ද?

(vii) ''අග පිපි මල් මලීගිය ලිය කැලේ යා''

(අ) මෙම කවිය ඇතුළත් කෘතියෙහි නම කුමක් ද?

(ආ) එය රචනා කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(viii) ''එහෙම දෙයක් ගැන අහලවත් නැතුව ඇති මයෙ හිතේ'

(අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ තැනැත්තාගේ නම ලියන්න.

(ආ) ''එහෙම දෙයක්'' යන්නෙන් අදහස් කළේ කුමක් ද?

(ix) (අ) ''දෑතේ කර ගැට සිඹ සනසන්නට'' යන ගීතයෙහි රචකයා නම් කරන්න.

(ආ) එතුමා විසින් රචනා කෙරුණු නවකතාවක නම ලියන්න.

(x) (අ) ''ගංගාවේ සංගීතය'' පද්‍ය පන්තියෙහි රචකයා නම් කරන්න.

(ආ) ඔහු අයත් සාහිත්‍ය යුගය කුමක් ද?

(ලකුණු 2 × 10 = 20)

(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) හුණු දඬු අගදී පිළිසිඹියා පත් රහත් ව හුණ දණ්ඩෙන් බැස පියා බුදුන් ළඟට ගොසින් පසඟ පිහිටුවා වැඳ ගෙන ...

(අ) අංකිත පදවල අර්ථ පැහැදිලි කරන්න.

(ආ) මින් පසු උග්ගසේනයන් බුදුන්ගෙන් කළ ඉල්ලීම කුමක් ද?

(ii) නිමල් සඳ පහන් වැනි වැලි පිට උදුළ
සුපුල් මල් යහන් ලිය මඩු ලිය ගෙ පෙළ

(අ) අංකිත පදවල අරුත් දක්වන්න.

(ආ) මෙහි සඳහන් උපමාව හා උපමේය ඔබේ වචනයෙන් ලියන්න.

(iii) ''බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එබස් අසා දණ්ඩෙන් ගසන ලද ආශීර්විෂයක්හු මෙන් ක්‍රෝධයෙන් දිලිහී කිපුණාහු''

(අ) මෙසේ බ්‍රහ්මදත්ත රජු කෝපයට පත් වූයේ ඇයි?

(ආ) මෙහි එන උපමාවෙහි උචිත බව පේළි දෙකකින් පැහැදිලි කරන්න.

(iv) ගිම්හානයේ ගිලන් වී කෘශව සුදුමැලිව
ඇදී ඇදී ඉකි ගැසූ ගඟ නැවත පිරිපුන්ය
දුෂ්කරය කියා හැර යා යුතු ද ජීවිතය
.............................................................................

(අ) මෙහි ඉතිරි පද්‍ය පාදය සම්පූර්ණ කරන්න.

(ආ) 'ඉකි ගැසූ' යන යෙදුමෙන් අදහස් වන කාව්‍යාලංකාරය කුමක් ද?

(v) මේ පුංචි පැටවා මහා එකාටත් වඩා ලස්සන විය.

(අ) 'පුංචි පැටවා' 'මහ එකා' යනුවෙන් අදහස් කළේ මොනවා ද?

(ආ) මෙම පාඨයෙන් කථිකයාගේ කුමන හැඟීමක් නිරූපණය වේ ද?

(ලකුණු 4 × 5 = 20)

(03) (අ) සංවාදශීලී බස් වහරත්

(ආ) කෙටි වැකි භාවිතයත්

මගින් 'අඟුල්මල් දමනය' කතාවෙහි තේමාව වඩාත් හොඳින් නිරූපණය වෙයි. එක් කරුණකට උදාහරණ **දෙක බැගින්** ගෙන මේ පිළිබඳ විමසීමක් කරන්න.

**නැතහොත්,**

''දියමන්ති මාලය'' කෙටිකතාවෙහි එන මැටිල්ඩා,

(ලකුණු 15)

(අ) සිහින ලොවක ජීවත් වී

(ආ) සැබෑ ලොවට පිය මං කරන අයුරු

අපූර්ව ආකාරයෙන් ඉදිරිපත් කිරීමට කතුවරයා සමත් වූ ආකාරය එක් කරුණකට උදාහරණ **දෙක බැගින්** ගෙන පැහැදිලි කරන්න.

(04) (අ) මිනිස් සමූහයාගේත්

(ආ) සත්ත්ව සමූහයාගේත් (ලකුණු 15)

සුපුරුදු චර්යා රටා වෙනස් වූයේ ගුත්තිල පඬිතුමාගේ මධුර වූ වීණා නාදය ශ්‍රවණය කිරීම නිසා ම ය. එක් කරුණකට උදාහරණ **දෙක බැගින්** ගෙන මෙම කියමන සනාථ කරන්න.

**නැතහොත්,**

(අ) ජන ව්‍යවහාර භාෂාවත් (ලකුණු 15)

(ආ) සම්භාව්‍ය භාෂාවත්

මනා සේ සංකලනය වීමෙන් 'වස්සානය' පද්‍ය පන්තිය රසවත් නිර්මාණයක් බවට පත් වී ඇති ආකාරය එක් කරුණකට උදාහරණ **දෙක බැගින්** ගෙන පැහැදිලි කරන්න.

(05) 'උචිත භාෂා අලංකාර මගින් සුපෝෂණය වූ 'බැද්දේගම' නවකතාව පාඨක සිත් ඇඳ බැඳ තබා ගැනීමට හේතු වූයේ කතුවරයා සතු ප්‍රතිභාව යි'. උදාහරණ **තුනක් මගින්** මේ පිළිබඳ විවරණයක් කරන්න.

(ලකුණු 10)

(06) 'සාම්ප්‍රදායික උපමා මගින් බැහැර වී ස්වාධීන කාව්‍යමය සංකල්ප මගින් 'හංස සංදේශය' රචනා වී ඇත' නිර්දිෂ්ට පද්‍ය පන්තියෙන් උදාහරණ **තුනක් ගෙන** මේ පිළිබඳ විමසන්න. (ලකුණු 10)

(07) සිද්ධි හා අවස්ථා නිරූපණය සජීවී ව ඉදිරිපත් කිරීම මගින් 'අපට වැසිකිළියක්' කෙටි කතාව සාර්ථක වූ ආකාරය උදාහරණ **තුනක් මගින්** පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ලකුණු 10)